# කැලණිය විශ්වවිද්‍යාලය

## සමාජීය විද්‍යා පීඨය

### පුස්තකාල හා විඥාපන විද්‍යා අධ්‍යයනාංශය

**පුස්තකාල හා විඥාපන විද්‍යා ඩිප්ලෝමා පාඨමාලා සඳහා ලියාපදිංචි කිරීම - 2019**

1. **පුස්තකාල හා විඥාපන විද්‍යා ඩිප්ලෝමා පාඨමාලාව - ප්‍රථම කොටස**

   අ.පො.ස. (උ:පෙ) විෂයයන් 03 කින් එකවර සාමාර්ථ්‍යය හෝ අ.පො.ස. (සා:පෙ) සාමාර්ථ්‍යය සමඟ පිළිගත් පුස්තකාලයක වසර තුනකට නොඅඩු පළපුරුද්දක් තිබිය යුතුය.
   අ.පො.ස. (සා:පෙ) ඉංග්‍රීසි විෂයෙන් සාමාර්ථ්‍යය ලබා තිබීම අනිවාර්ය යි. (ඉංග්‍රීසි විෂය අසමත් අය අධ්‍යයනාංශය මගින් පවත්වනු ලබන ඉංග්‍රීසි පරීක්ෂණය සමත් විය යුතුයි.)

2. **පුස්තකාල හා විඥාපන විද්‍යා ඩිප්ලෝමා පාඨමාලාව - දෙවන කොටස**

   කැලණිය විශ්වවිද්‍යාලයේ පුස්තකාල හා විඥාපන විද්‍යා ඩිප්ලෝමා පාඨමාලාවේ ප්‍රථම කොටස පරීක්ෂණයෙන් සමත් වීම හෝ ඊට සමාන සුදුසුකම්

3. **පුස්තකාල හා විඥාපන විද්‍යා උසස් ඩිප්ලෝමා පාඨමාලාව**

   කැලණිය විශ්වවිද්‍යාලයේ පුස්තකාල හා විඥාපන විද්‍යා ඩිප්ලෝමා පාඨමාලාවේ දෙවන කොටස පරීක්ෂණයෙන් සමත් වීම හෝ කැලණිය විශ්වවිද්‍යාලයේ පුස්තකාල විද්‍යාව විෂයයක් වශයෙන් හදාරා ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධිය සමත් වීම හෝ ඊට සමාන සුදුසුකම්

**අයදුම්පත්:**

කැලණිය මහජන බැංකු ශාඛාවේ අංක 055-1001-10667549 දරන ගිණුමට රු. 750/= ක් බැර කරන ලද ලදුපතක් පුස්තකාල හා විඥාපන විද්‍යා අධ්‍යයන අංශය වෙත 2019.01.21 සිට 2019.02.24 දින දක්වා පැමිණ ඉදිරිපත් කිරීමෙන් අයදුම්පත සහ විස්තර පත්‍රිකාව ලබා ගත හැකිය.

තැපෑලෙන් අයදුම්පත් ලබාගැනීම සඳහා ඉල්ලුම් කරන විට ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරේ " **පුස්තකාල හා විඥාපන විද්‍යා ඩිප්ලෝමා පාඨමාලා අයදුම්පත් ලබාගැනීම"** යනුවෙන් සඳහන් කළ යුතු අතර ඉහත ගිණුමට රු. 750/= ක් බැර කරන ලද ලදුපතක් සමඟ අයදුම්කරුගේ නම හා ලිපිනය ලියන ලද මුද්දර ඇලවූ "9x4" ප්‍රමාණයේ ලියුම් කවරයක්, **පාඨමාලා සම්බන්ධීකාරක, පුස්තකාල හා විඥාපන විද්‍යා අධ්‍යයනාංශය, කැලණිය විශ්වවිද්‍යාලය, කැලණිය** ලිපිනයට එවිය යුතුය.

සම්පූර්ණ කරන ලද අයදුම්පත් 2019.03.07 දින හෝ ඊට ප්‍රථම ලැබෙන සේ "9x4" ප්‍රමාණයේ ලියුම් කවරයක බහා ඉහත ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු අතර කවරයේ ඉහළ වම් කෙළවරේ **"පුස්තකාල හා විඥාපන විද්‍යා ඩිප්ලෝමා පාඨමාලා සඳහා ලියාපදිංචි වීම - 2019"** යනුවෙන් සඳහන් කළ යුතුය.

ලේඛකාධිකාරී
කැලණිය විශ්වවිද්‍යාලය
............................